
ضيوف الرحمن
hajjumrh.com

# හජ් වන්දනාව ඉටු කරන ක්‍රමය පිළිබඳ සංෂිප්තය



සියලු පැසසුම් විශ්වයේ පරමාධිපති අල්ලාහ්ට ම හිමි ය. අපගේ නබිවරයාණන් වන දේව දූත මුහම්මද් තුමාණන්ටත් එතුමාණන්ගේ පවුලේ උදවියටත් එතුමාණන්ගේ හිත මිතුරන් ඇතුළු සියලු දෙනා හටත් ශාන්තිය හා සමාදානය අත් වේවා!

**මෙම ප්‍රකාශයට පසු**

**මෙය හජ් වන්දනාව ඉටු කරන ක්‍රමය පිළිබඳ සඳහන් කෙටි ලිපියකි. මෙහි දී හජ් වන්දනාකරුට අවශ්‍ය බොහෝ දේ පැහැදිලි කිරීමට අපි අපේක්ෂා කළෙමු .**

මෙය ගෞරවණීය අල්ලාහ්ගේ තෘප්තිය උදෙසා කෙරෙන අවංක සේවයක් ලෙස හා පොදුවේ මුස්ලිම්වරුන් හට ප්‍රතිලාභ ගෙන දෙන්නක් ලෙස පත් කර දෙන මෙන් අපි අල්ලාහ්ගෙන් ඉල්ලා සිටිමු.

**විවිධ භාෂාවන්ගෙන් ඉස්ලාමීය අන්තර්ගත සේවා සංගමයේ අධ්‍යාපන කමිටුව**



ضيوف الرحمن
hajjumrh.com

# පළමුව: නැමදුම පිළිගනු ලැබීමේ කොන්දේසි



ضيوف الرحمن
hajjumrh.com

නැමදුම සර්වබලධාරී අල්ලාහ් අභියස පිළිගනු ලැබීමට නම්,
**කොන්දේසි දෙකක් ඇත**

## 1 ඉඛ්ලාස්

හෙවත් අවංකභාවය: එනම් එමගින් අල්ලාහ්ගේ තෘප්තිය හා මතුලොව අපේක්ෂා කිරීමය. සර්වබලධාරී අල්ලාහ් මෙසේ පවසයි

"وَمَا أُمِرُوا إِلَّا لِيَعْبُدُوا اللَّهَ مُخْلِصِينَ لَهُ الدِّينَ حُنَفَاءَ"

තවද පිවිතුරු දහම අල්ලාහ්ට පුද කරමින් ඔහු ව නැමදීමටත් සලාතය ස්ථාපිත කිරීමටත් zසකාත් පිරිනැමීමටත් මිස ඔවුහු අණ කරනු නොලැබුවෝය (1)

නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණෝ මෙසේ පැවසූහ "إنَّما الأَعْمالُ بِالنِّيّاتِ، وإنَّما لِكُلِّ امرِئٍ ما نَوَى "
"ක්‍රියාවන් පිහිටනුයේ චේතනාවන් අනුවය. සෑම පුද්ගලයකුටම ඔහු පතන දෑ ඇත" බුහාරි (1) මුස්ලිම් (1907)

## 2 එහි දී නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන්ව ප්‍රකාශයෙන් හා ක්‍රියාවෙන් පිළිපැදීම

එතුමාණෝ මෙසේ පැවසූහ
"من أحدث في أمرنا هذا ما ليس منه فهو رد"


අපගේ කටයුත්තට (ඉස්ලාමයට), එහි නොමැති නවීන ක්‍රම සහ වීධි කවරෙකු ඇතුළු කරන්නේ ද එය ප්‍රතික්ෂේප කරනු ලැබේ බුහාරි (2697) මුස්ලිම් (1718) මුස්ලිම් හි තවත් (2697)
අප විෂයයෙහි නොමැති ක්‍රියාවක්, කවරෙකු සිදු කරන්නේද එය ප්‍රතික්ෂේප කරනු ලැබූවකි

---

(1) එහි අර්ථය වනුයේ: ඔහු හා ඔහුට නැමදුම් කිරීම අපේක්ෂා කරමින්, ඔහු හැර අනෙකුත් සියලු දෑ ප්‍රතික්ෂේප කරමින් සිදු කිරීමයි 'තෆ්සීර් අස්-සෑදී' පිටු( 538)

ضيوف الرحمن
hajjumrh.com

# හජ් වන්දනාව ඉටු කරන ක්‍රමය පිළිබඳ කෙටි සඳහන



# පළමුව: මීකාත් හෙවත් සීමා මාඉම් පිළිබඳ නීතිරීති



1 **අල්-මීකාත්:** හජ් හෝ උම්රා ඉටු කිරීමට අපේක්ෂා කරන උදවිය ඉහ්රාම් පැළඳ ගැනීම සඳහා නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් නියම කළ ස්ථාන වේ

2 හජ් හෝ උම්රා ඉටු කිරීමට අදිෂ්ඨාන කරමින් කවරෙකු ඒ එක් ස්ථානයක් අසළින් ගමන් ගන්නේ ද එහි ඉහ්රාම් ඇඳ ගැනීම අනිවාර්යය වේ. ඉහ්රාමය පැළඳ ගැනීමෙන් තොරව එය පසුකර යෑම වලංගු වන්නේ නැත

3 කවරෙකු මෙම මීකාත් හෙවත් සීමා මාඉම්වලට වඩා මක්කාවට සමීපයෙන් පදිංචිව සිටින්නේ ද ඔහුගේ සීමා මාඉම ඔහු සිටින ස්ථානයම වේ. එතැන් සිට ඔහු හජ් හා උම්රා සඳහා ඉහ්රාම් පළඳියි

4 **මක්කාවාසීන් හා එහි පදිංචිව සිටින්නන්න වනාහි:** හජ් සඳහා ඉහ්රාමය මක්කාවේ සිටම බැඳ ගනිති. උම්රා වන්දනාව වනාහි: ඔවුන් හරම් සීමාවෙන් පිටතට ගොස් උදාහරණයක් ලෙස තන්ඊම් හා එවන් ස්ථානය වෙත ගොස් එහි සිට ඉහ්රාමය ඇඳ ගනිති

5 කවරෙකු ගුවන් යානයක සිටින්නේ ද ඇත්තෙන්ම ඔහු අදාළ සීමා මායිමට සමාන්තරව අනුගත වූ විට ඉහ්රාම් තත්ත්වයට පැමිණේ. අදාළ මීකාතයට අනුගත වීමට පෙර ඒ සඳහා පූර්ව සූදානමින් ඉහ්රාම් ඇඳුම අඳියි. එයට අනුගත වීමත් සමග ඒ තත්ත්වයේ ඉහ්රාමයේ චේතනාව තබයි. ගුවන් තොටුපලින් බසින තෙක් එය ප් රමාද කිරීම ඔහුට වලංගු වන්නේ නැත. පූර්ව ප් රවේසමක් වශයෙන් ගුවන් යානය වේගයෙන් ගමන් කරන බැවින් අදාළ මීකාතයට අනුගත වීමට පෙර තල්බිය්යා පැවසීම මඟ හැරෙනු ඇතැයි බියක් වී නම් .ඊට පෙරම ඔහු තක්බීර් පැවසිය හැක

ضيوف الرحمن
hajjumrh.com

# දෙවැන්න: හජ් වන්දනාවේ වර්ග හා ඒවායෙහි නීතිරීති



ضيوف الرحمن
hajjumrh.com

# තුන්වැන්න: ඉහ්රාම් පළඳින ක්‍රමය හා එහි නීතිරීති



ضيوف الرحمن
hajjumrh.com

## ඉහ්රාමය පැළඳීමට අදිටන් කරන්නා පහත සඳහන් දෑ ඉටු කිරීමට ආගමික වශයෙන් බැඳී සිටියි

1 **ස්නානය කිරීම:** පිරිමින් හා කාන්තාවන්, ඔසප් තත්ත්වයේ පසුවන හා පශ්චාත් දරු ප්රසූතියෙන් පසු රුධිර වහනය වන තත්ත්වයේ පසුවන කාන්තාවන් ඇතුළුව සියලු දෙනා ස්නානය කර ගැනීම වඩාත් වැදගත් සුන්නාවකි

2 පුද්ගලයකුට ලැබෙන ඌද් හෝ එවැනි වඩාත් සුවඳැති සුවඳ විළවුන් ඔහුගේ හිසට හා ඔහුගේ යටි රැවුලට ගැල්වීම. ඉහ්රාම් ඇඳගත් පසු පවා එය පැවතීම ඔහුට හානියක් වන්නේ නැත. කාන්තාව වනාහි, සුවඳැති සුවඳ විළවුන් ගැල්වීම ඇයට සුදුසු වන්නේ නැත. මක්නිසාදයත් ඇයගේ සුවඳ පිටස්තර පිරිමින් ආග්රාණය කිරීමට ඉඩ ඇති බැවිනි

2 **ඉහ්රාම් ඇඳුම ඇඳීම:** එය උඩු සළුවක් හා යටි සළුවකි. සුන්නාව වනුයේ ඒ දෙකම පිරිසිදු මෙන්ම සුදුවන් දෙකක් වීමය. එසේ නැතහොත් දෙකම අලුත් වීම ය. කාන්තාවගේ ඉහ්රාම් ඇඳුම වනාහි, අලංකාරය ඉස්මතු නොකරන, ඇය අඳින කැමති ඇඳුමකි. නමුත් ඇය මුහුණු ආවරණය හෝ අත් වැසුම් පැළඳීමෙන් වැළකී සිටිය යුතුය. ඒ හැර වෙනත් දැයකින් ඇගේ මුහුණු හා .අත් දෙක ආවරණය කර ගනී

ضيوف الرحمن
hajjumrh.com

# වන්දනා ක්‍රම වර්ග තුනකි

## තමත්තුඃ, ඉෆ්රාද් හා කිරාන් ය



1 **තමත්තුඃ** මෙම ක්‍රමය වඩාත් උතුම් වනුයේ සත්ව කැපය රැගෙන නොයන අයටය. එනම්: හජ් මාසවල දී උම්රා සඳහා ඉහ්රාම් පැළඳගෙන, තවාෆ් සිදු කර සඊ ද සිදු කර ඉහ්රාමයෙන් ඉවත් වී පසුව එම වසරේම හජ් සඳහා ඉහ්රාම්හි චේතනාව තැබීම ය

2 **අල්-ඉෆ්රාද්:** හජ් සඳහා පමණක් චේතනා කරමින් ඉහ්රාම් පැළඳ ගැනීම, මක්කාවට පැමිණි විට සම්ප් රාප්තවීමේ තවාෆ් ඉටු කිරීම ඔහුට සුන්නාවක් වන අතර පසුව හජ්හි සඊ ඉටු කරයි. එනමුත් ඉන්පසු ඔහු හිස මුඩු කිරීමක් හෝ කොට කිරීමක් සිදු නොකරන අතර ඔහුගේ ඉහ්රාමයෙන් ඔහු නිදහස් වන්නේ ද නැත. උත්සව දින අකබාවට ගල් විසි කිරීමෙන් පසු ඉහ්රාමය ගලවන තෙක්ම ඔහු එම ඉහ්රාමයත් සමගම සිටී. හජ් හි තවාෆයට පසුව හජ්හි සඊ ඉටු කිරීම ප්‍රමාද .කළේ නම් එහි වරදක් නැත

3 **කිරාන්:** උම්රා හා හජ් සඳහා එකවර ඉහ්රාම් බැඳීම :එවිට ඔහු මෙසේ පවසයි
(ලබ්බයික් අල්ලාහුම්ම උම්රතන් වහජ්ජන්)
කිරාන් ක්‍රමයට හජ් ඉටු කරන්නාගේ ක්‍රියාව ඉෆ්රාද් ක්‍රමයට හජ් ඉටු කරන්නාගේ ක්‍රියාවට සමානය. නමුත් කිරාන් ක්‍රමයට ඉටු කරන්නා සත්ව කැපයක් ලබා දිය යුතු අතර ඉෆ්රාද් ක්‍රමයට ඉටු කරන්නා එසේ .සත්ව කැපයක් ලබා දිය යුතු නැත

4 ආගමානුගත කරන ලද අනිවාර්යය හෝ අතිරේක සලාතයකින් පසු ඉහ්රාම් පැළඳීම. එය අනිවාර්යය නොවේ . එවිට ඔහු උම්රා ඉටු කරන්නෙකු වී නම්, "ලබ්බයික් අල්ලාහුම්ම උම්රතන්" යනුවෙන් ද ඉෆ්රාද් ක්රමයට හජ් ඉටු කරන්නෙකු වී නම් "ලබ්බයික් අල්ලාහුම්ම හජ්ජන්" යනුවෙන් ද ඔහු කිරාන් ක්රමයට හජ් ඉටු කරන්නෙකු වී නම් "ලබ්බයික අල්ලාහුම්ම උම්රතන් වහජ්ජන්" යනුවෙන් ද පවසයි

ඉහ්රාමය සඳහා අපේක්ෂා කරන තැනැත්තා තම වන්දනා කටයුතු සම්පූර්ණ කිරීමට බාධා කරන යම් බාධකයක් ගැන බිය වූයේ නම්, ඉහ්රාම් පළඳින අවස්ථාවේ මෙසේ කොන්දේසි පනවා ගත යුතුයි. එනම්: "දෙවිඳුනි! මා ඔබට පිළිතුරු දෙමින් හඬා එමි, යම් බාධකයක් මා අවහිර කළේ නම්, එය මා බාධා කළ තත්ත්වයේ මම ඉන් ඉවත් වෙමි) එසේ කවරෙකු කොන්දේසි පනවාගෙන ඔහුගේ වන්දනා කටයුතු සම්පූර්ණ කිරීමට යම් බාධාවක් ඔහුට ඇති වූ විටෙක ඔහුට ඉහ්රාමයෙන් ඉවත් විය හැකි අතර ඒ සඳහා ඔහු කෙරෙහි කිසිදු ප්රතිකර්මයක් නොපිහිටනු ඇත

5 පසුව අධික ලෙස තල්බියා පැවසිය යුතුය. එනම්

"لَبَّيْكَ اللَّهُمَّ لَبَّيْكَ، لَبَّيْكَ لاَ شَرِيكَ لَكَ لَبَّيْكَ، إِنَّ الحَمْدَ وَالنِّعْمَةَ لَكَ وَالمُلْكَ لاَ شَرِيكَ لَكَ" ٢

ලබ්බයික අල්ලාහුම්ම ලබ්බයික්, ලබ්බයික ලා ෂරීක ලක' ලබ්බයික්, ඉන්නල් හම්ද වන්-නිඃමත ලක වල් මුල්ක්, ලා ෂරීක ලක් (2)

---

(2) මිනිසා පවසන මෙම ප්රකාශයේ තේරුම "ලබ්බයික්" එනම්: මාගේ පරමාධිපතියාණනි! එකකින් පසු තවෙකක් ලෙස මම ඔබට පිළිතුරු දෙමි. එහි තේරුම: මිනිසා තම පරමාධිපතිට අවනත විය යුතු කරුණ ක්රියාත්මක කිරීම සඳහා පිළිතුරු දීමකි. "ඉන්නල් හම්දූ වන්නිඃමත ලක වල් මුල්ක්" මෙහි 'හම්ද්' යනු ආදරයෙන් හා ගෞරවයෙන් යුතු පූර්ණ ප්රශංසාව හිමි වීමේ ගුණාංගයයි. එසේ නැවත නැවත පවසන විට පැසසුමක් බවට පත් වේ. 'නිඃමත' යනු අල්ලාහ් තම ගැතතන් හට ඔවුන්ගේ අවශ්යතා ලබා දීමෙන් හා පිළිකුල් සහගත දැයින් ඔවුන් වැළැක්වීමෙන් ඔහුට කරන ආශිර්වාදයයි. 'අල්-මුල්ක්' යන ප්රකාශය වනාහි අල්ලාහ් සතු සර්ව රාජ්යයයි. උත්තරීතර අල්ලාහ් අති උත්කෘෂ්ට විය. ඔහු පමණය අධිපති. 'ලා ෂරීක ලහූ' යන ප්රකාශය වනාහි, එනම් අල්ලාහ්ට නියම වූ පරිපූර්ණ ගුණාංග කිසිවක්, ඔහුට සම කළ හැකි කිසිවක් නොමැති බව ය. සර්ව රාජ්යයේ හිමිකාරත්වය ඔහුට පමණක් සතුය. එය (96/22) 'මැවීමේ සා සැලසුම් කිරීමේ බලය හා දේව බලය යනාදියයි. 'මජ්මූඃ ෆතාවා වරසාඉලිල් උසෙයිමීන් .සාරාංශය



**පිරිමියා මෙය උස් හඬින් පවසයි. කාන්තාව ද පිටස්තර පිරිමින් නැති තැන එසේ ඩින් පවසන්නීය.** ඉහ්රාම් ඇඳගත් තැනැත්තා අධික ලෙස තල්බියා පැවසිය යුතුය. විශේෂයෙන් තත්ත්වයන් හා කාලයන් වෙනස් වන විට, උදාහරණයක් ලෙස ඉහළට නගින විට උස් හඬින් ද පහළට බසින විට පහත් හඬින් ද රාත්‍රිය හෝ දහවලට එළැඹෙන විට ද යනාදියෙනි

6

උම්රාවෙහි තල්බිය්යා පැවසීම ආගමානුග වේ සිට තවාෆය ආරම්භ කරන තෙක් ය. හජ්හි ආගමානුගත වනුයේ ඉහ්රාම් පැළඳගත් අවස්ථාවේ සිට අවුරුදු දින අකබාවට ගල් විසි කිරීමට ආරම්භ කරන තෙක් ය ·

ඉහ්රාම් ඇඳගත් තැනැත්තා, ඉහ්රාමයෙන් නිදහස් වන තෙක් ඉහ්රාමය තුළ තහනම් කරන ලද කිසිදු කරුණක නියැලීමෙන් ඔහු ප්‍රවේසම් විය යුතුයි ·

# සිව්වැන්න: ඉහ්රාම්හි තහනම් කරන ලද දෑ



ضيوف الرحمن
hajjumrh.com

# ඉහ්රාම් තත්ත්වයේදී තහනම් කරන ලද දෑ මෙසේය



1. ශරීරයේ කවර හෝ ස්ථානයකින් වුව ද රෝම මුඩු කිරීම හෝ කොට කිරීම හෝ උගුලා දැමීම

2. අත් හා පාදවල නියපොතු සම්පූර්ණයෙන්ම හෝ කොටසක් හෝ කපා ඉවත් කිරීම

3. තොප්පිය, සළුව, ජටාව වැනි ශරීරය සමග ඇළී ඇති දැයකින් හිස ආවරණය කිරීම, හිස මතට පැළඳ ඇති සළුව එළීම, හිස මතට ලෙන්සුවක් හෝ පොරෝණයක් හෝ කාට්බෝඩ් කැබැල්ලක් හෝ තැබීම, එසේත් නැතහොත් ආවරණය යන අර්ථයෙන් එන කවර හෝ වෙනත් දෙයක් තැබීම. මෙය කාන්තාවට නොව පිරිමියාට පමණක් අදාළ වන තහනම් නීතියකි

4. ශරීරයට ගැලපෙන පරිදි සුපුරුදු ඇඳුම් ඇඳීම, එනම් සාමන්‍ය ඇඳුමෙන් සැරසීමය. උදාහරණ ලෙස මිම්මට මැසූ ඇඳුමක්, කලිසමක්, කමිසයක්, මේස් ජෝඩුවක් අත්වැසුම් ජෝඩුවක් වැනි දෑ ය. මෙය කාන්තාවට නොව, පිරිමියාට පමණක් විශේෂිත තහනමකි. ඇයට තහනම් කරනු ලැබ ඇත්තේ :

- නිකාබයක් හෝ බුර්කාවක් හෝ නිකාබයට සමාන වේල් එකක් පැළඳීම. පිටස්තර පිරිමින් ඉදිරියේ සුපුරුදු මුහුණු ආවරණයෙන් තම මුහුණ ආවරණය කළ යුතුය. එම ආවරණය ඇගේ මුහුණ ස්පර්ශ කළත් එලෙස ය. ඇගේ මුහුණ ස්පර්ශ වීම වැළැක්වීම සඳහා හිස් වැස්මක් හෝ ඒ හා සමාන දෙයක් ඇගේ හිස මත පැළඳීමට ඇයට අවසර නැත. මන්ද එහි ආගමික වශයෙන් කිසිදු සාක්ෂියක් නොමැති බැවිනි

- ඇගේ අත් දෙකෙහි අත් වැසුම් පැළඳීම. නමුත් පිටස්තර පිරිමින් ඉදිරියේ ඇගේ කබාය තුළ අත් දෙක සඟවා ගනිමින් ඇය ඒ දෙක ආවරණය කළ යුතුයි

5. ශරීරයට හෝ ඉහ්රාම් ඇඳුමට සුවඳ විළවුන් ගැල්වීම

6. ගොඩබිම සතුන් මරා දැමීම හෝ මරා නොදැමුවත් උන් දඩයම් කිරීම

7. තමන් වෙනුවෙන් හෝ වෙනත් කෙනෙකු වෙනුවෙන් හෝ විවාහය ගැන කතා කිරීම

8. විවාහය ගිවිස ගැනීම

9. සංසර්ගයේ නිරත නොවූව ද කාමුක හැඟීමෙන් යුතුව සිප ගැනීම හා ස්පර්ශ කිරීම වැනි අඹුසැමි ඇසුරුකම් පැවැත්වීම

10. සංසර්ගයේ නිරත වීම, එනම් යෝනි මාර්ගයේ ලිංගිකව හැසිරීම



ضيوف الرحمن
hajjumrh.com

# පස්වැන්න: තවාෆ් සිදු කරන ක්‍රමය



1 ඉහ්රාම් ඇඳගත් තැනැත්තා මස්ජිදුල් හරාම් වෙත පිවිසුනු විටෙක දකුණු කකුල ඉදිරියට තබා මස්ජිදයට පිවිසීමේ දී පැවසිය යුතු ප්රාර්ථනාව සහ ඒ සම්බන්ධයෙන් වාර්තා වී ඇති නිවැරදි ප්රාර්ථනාවන් උසුරා පිවිසීම සුන්නත් වේ "اللهم افتح لي أبواب رحمتك"
"අල්ලාහුම්මෆ්තහ්ලී අබ්වාබ රහ්මතික"
(දෙවිඳුනි! ඔබේ ආශිර්වාදයේ දොරටු මා වෙනුවෙන් විවෘත කරනු මැනව)

2 මෙය මස්ජිදුල් හරාමයට පමණක් සීමා වූ ප්රාර්ථනාවක් නොව කවර හෝ මස්ජිදයකට පිවිසුණ ද මෙම ප්රාර්ථනාව උසුරනු ලැබේ

3 පසුව තවාෆ්හි නිරත වීමට අපේක්ෂා කළ විටෙක, ඔහු ඉල්තිබාඃ ක්රමයට ඉහ්රාමය සකසා ගනී. එනම් උඩු සළුවේ මැද කොටස දකුණු කිහිල්ල තුළ තබා, එහි කෙළවරවල් දෙක වම් උරහිස මත තැබීමය. තවාෆය අවසන් කළ විට තවාෆයට පෙර පැවති තත්ත්වයටම නැවත ඔහුගේ සළුව වෙනස් කර ගනී. ඊට හේතුව ඉල්තිබාඃ ක්රමය පිළිපදිනු ලබනුයේ තවාෆ් සිදු කරන ස්ථානයේ පමණක් වන බැවිනි

පසුව හජරුල් අස්වද් (කළු ගල) වෙත ඉදිරියට ගොස්, එම ගල තම දකුණතින් ස්පර්ශ කොට එය සිප ගනී. සිප ගැනීමට පහසුකමක් නොලැබේ නම් එය අතින් පමණක් ස්පර්ශ කර පසුව අත සිප ගනී. එසේ අතින් ස්පර්ශ කිරීමටත් ඔහුට පහසුකමක් නොලැබුවේ නම් ඔහු සමග ඇති සැරයටිය හා එවැනි යම් වස්තුවකින් එය ස්පර්ශ කර පසුව එය සිප ගනී. එයට ද පහසුකමක් නොලැබුවේ නම් ගල දෙසට මුහුණලා අතින් ඒ වෙත සළකුණු කරයි. එය සිප නොගනියි. වඩාත් උතුම් වන්නේ තදබදයක් ඇති නොවන්නටත්, ජනයාට හානියක් නොවන්නටත් එමගින් ඔවුන් පීඩාවට පත් නොවන්නටත් වගබලා ගැනීමයි

4 ගල ස්පර්ශ කරන අවස්ථාවේ හෝ එයට සංඥා කරන අවස්ථාවේ "අල්ලාහු අක්බර්" (අල්ලාහ් අති ශ්‍රේෂ්ඨය) යැයි පැවසීම

5 පසුව දකුණු දෙසට ගොස් තම වම් පැත්තට ශුද්ධ ගෘහය පිහිටන සේ සිටගෙන තවාෆ් සිදු කරයි. රුක්නුල් යමානියට ළඟා වූ විටෙක එය සිප ගැනීමකින් තොරව සප්ර්ශ කරයි, ඒ සඳහා පහසුකමක් නොමැත්තේ නම්, තදබදයක් ඇති කර නොගත යුතුය. ඒ වෙත සංඥා නොකළ යුතුය

6 රුක්නුල් යමානි සහ හජරුල් අස්වද් අතර මෙසේ පවසයි : (رَبَّنَا آتِنَا فِي الدُّنْيَا حَسَنَةً وَفِي الْآخِرَةِ حَسَنَةً وَقِنَا عَذَابَ النَّارِ)

« රබ්බනා ආතිනා ෆිද් දුන්යා හසනතන් වෆිල් ආකිඃරති හසනතන් වකිනා අදාබන් නාර් »


7 හජරුල් අස්වද් කොණ පසු කර යන සෑම අවස්ථාවකම තම අතින් ඒ දෙස සළකුණු කර 'අල්ලාහු අක්බර්' යැයි පවසයි

8 තවාෆයේ ඉතිරි අවස්ථාවන්හි තමන් කැමති දේව ගුණ ගායනා, ප්‍රාර්ථනා හා කුර්ආන් කියවීම් සිදු කරයි



9 **සුන්නාව වනුයේ පළමු වට තුන පමණක් රම්ල් දිවීමය.** රම්ල් යනු පියවරවල් ළඟ ළඟ තබා මද වේගයකින් ගමන් කිරීමය

10 **තවාෆ් සම්පූර්ණ කළ විට, 'මකාමු ඉබ්රාහීම්'** වෙත යනුවෙන් "وَاتَّخِذُوا مِنْ مَقَامِ إِبْرَاهِيمَ مُصَلًّى" ඉදිරියට ගොස් පාරායනය කර පසුව පහසු පරිදි එහි පසුපස්සට වී රකආත් දෙකක් සලාත් ඉටු කරයි. එසේ නොමැති වූ විටෙක, මස්ජිදයේ කවර හෝ ස්ථානයක එම රකආත් දෙක ඉටු කරයි. පළමු රකආතයේ සූරා අල්-ෆාතිහා පාරායනය කිරීමෙන් පසු "කුල් යා අය්යුහල් කාෆිරූන්" සහ දෙවන රකආතයේ සූරා අල්-ෆාතිහාවට පසු "කුල් .හුවල්ලාහු අහද්" යන සූරාවන් පාරායනය කරනු ඇත



# සයවැන්න: සර් ඉටු කිරීමේ ක්රමය



1 තවාෆ් අවසන් කර එහි රකආත් දෙක ද ඉටු කළ විට, ඔහු සඊ කරන ස්ථානය වෙත පිටත්ව යයි. සෆා කන්දට යනුවෙන් "إِنَّ الصَّفَا وَالْمَرْوَةَ مِنْ شَعَائِرِ اللَّهِ" ළඟා වූ විටෙක අල්ලාහ් ආරම්භ කළ දැයින් මම "أبدأ بما بدأ الله به" පවසා ආරම්භ කරමි යැයි පවසයි

2 පසුව කඃබාව දකින තරමට හෝ ඒ දිශාවට යොමු විය හැකි අයුරින් 'සෆා' කන්දට නැග ඒ දිශාවට මුහුණලා අල්ලාහ්ව ඒකීයත්වයට පත් කරමින් හා ශ්‍රේෂ්ඨත්වයට පත් කරමින් මෙසේ ප්‍රකාශ කරයි

لا إله إلا الله وحده لا شريك له، له الملك وله الحمد، وهو على كل شيء قدير، لا إله إلا الله وحده، أنجز وعده، ونصر عبده، وهزم الأحزاب وحده

ලා ඉලාහ ඉල්ලල්ලාහු වහ්දහු ලා ෂරීක ලහු, ලහුල් මුල්කු වලහුල් හම්දු, වහුව අලා කුල්ලි ෂෙයිඉන් කදීර්, ලා ඉලාහ ඉල්ලල්ලාහු වහ්දහූ, අන්ජස වඃදහූ, වනසර අබ්දහූ, වහසමල් අහ්සාබ වහ්දහූ

නැමදුමට සුදුස්සා අල්ලාහ් හැර වෙනත් දෙවියකු නැත. ඔහු ඒකීයය. ඔහුට සමාන කිසිවෙකු නැත. සර්ව රාජ්‍යය ඔහු සතුය. සියලු පැසසුම් ද ඔහු සතුය. ඔහු සියලු දෑ කෙරෙහි සර්වබලධාරීය. නැමදුමට සුදුස්සා අල්ලාහ් පමණක් හැර වෙනත් දෙවියෙකු නැත. ඔහුගේ ප්‍රතිඥාව ඔහු සැබෑ කළේය. ඔහුගේ ගැත්තාට ඔහු උපකාර කළේය. ඔහු තනිවම සියලු සේනාවන් පාරාජයට පත් කළේය. ඔහු මෙය තුන් වරක් පුනරුච්චාරණය කරන අතර, ඒ අතර කන්නලව් කරයි

3 පසුව සෆා කන්දෙන් බැස මර්වා වෙත පා ගමනින් යයි. කොළ පැහැති සංඥාව වෙත ළඟා වූ විට මඳ වේගයෙන් කඩිසර ලෙස දැඩිව ගමන් කරයි. දෙවන කොළ සංඥා වෙත ළඟා වූ විට සුපුරුදු පරිදි ගමන් කරයි. දැඩි සේ වේගයෙන් ගමන් කිරීම කාන්තාවන්ට ආගමානුගත කරන ලද්දක් නොවේ



4 මර්වා වෙත ළඟා වූ විටෙක, මර්වාවෙහි කටයුතු කළ ආකාරයෙන්ම එහි ද කටයුතු කිරීම ආගමානු ගත කරන (2 ලදී. පරිච්ඡේද අංක)

5 පසුව මර්වා සිට බැස නැවත සෆා වෙත පා ගමනින් යයි. කොළ පැහැති සංඥාව වෙත ළඟා වූ විට මද වේගයෙන් කඩිසර ලෙස දැඩිව ගමන් කරයි. දෙවන කොළ සංඥා වෙත ළඟා වූ විට සුපුරුදු පරිදි ගමන් කරයි

6 මෙලෙස වට හත සම්පූර්ණ කරන තෙක්ම කටයුතු කරයි. සෆා කන්දේ සිට මර්වා කන්ද දක්වා පිය නැගීම එක් වටයක් ලෙස සැළකේ. එමෙන්ම මර්වා සිට නැවත සෆා වෙත නැවත පැමිණීම තවත් වටයක් ලෙස සැළකේ

7 ඔහු සර් කරන අතරවාරයේ ඔහු කැමති දික්ර් (ගුණගායනා) ප්රාර්ථනාවන් හා කුර්ආන් පාරායනයන්හි නිරත වෙයි

# හත්වැන්න: හිස මුඩු කිරීමේ හා කොට කිරීමේ ක්‍රමය



1 උම්රා ඉටු කරන්නා තම තවාෆ් හා සඃයු සම්පූර්ණ කළ විට, ඔහු පිරිමියෙක් නම් හිස බූ ගෑම හෝ හිසකෙස් කොට කිරීම අනිවාර්යය වේ. සුන්නාව වනුයේ බූ ගෑම හෝ කොට කිරීම සම්පූර්ණ හිස ආවරණය වෙන සේ සිදු වීමය

2 හිස බූ ගෑම හිසකෙස් කොට කිරීමට වඩා උතුම් ය. නමුත් හජ් වන්දනා කාලයට සමීප නම් හිසේ හිසකෙස් වැවීමට ඉඩ ප්‍රස්ථාව ද ඇහිරී යන්නේ නම්, එවිට කොට කිරීම වඩාත් යෝග්‍යය වේ

3 කාන්තාවක් නම්, ඇගේ හිසකෙස්වල අගිස්ස ඇඟිලි පුරුකක තරම් කොට කර ගනියි

4 ඉෆ්රාද් ක්‍රමයට හෝ කිරාන් ක්‍රමයට හජ් ඉටු කරන තැනැත්තා අවුරුදු දින ජම්රතුල් අකබාවට ගල් ගැසීමෙන් පසුව මිස ඔහුගේ හිසකෙස් කපා නොදැමිය යුතුය

උම්රා කරන්නා ඔහුගේ උම්රාව අවසන් කරනුයේ එමගිනි එමෙන්ම තමත්තුඃ ක්‍රමයට හජ් ඉටු කරන්නා ද ඔහුගේ උම්රාවේ වන්දනාව මෙලෙස අවසන් කර ගනී



ضيوف الرحمن
hajjumrh.com

# හජ් ඉටුකරන ක්රමය



# පළමුව: හජ් සඳහා චේතනා තබමින් ඉහ්රාම් තත්ත්වයට පැමිණීම



1 හජ් වන්දනාව ඉටු කිරීමට අදිටන් කළ තැනැත්තා මක්කාවේ හෝ සීමා මාඉම් නොමැති ස්ථානයක හෝ සිටියේ නම්, දුල් හිජ්ජා මස අට වැනි 'තර්වියා දින' තමන් හජ් වන්දනාවට අදිටන් කළ තැන සිටම උදෑසන ඉහ්රාම් තත්ත්වයට පැමිණීම සුන්නා වේ. එසේ නොමැති නම් ඔහු පසු කර යන සීමා මාඉම් සිට ඉහ්රාම් තත්ත්වයට පැමිණෙයි

2 හජ් සඳහා චේතනා කර ඉහ්රාම් පළඳින්නා උම්රා සඳහා ඉහ්රාම් පළඳින අවස්ථාවේ ක්රියා කළ ආකාරයටම ක්රියා කරයි. එනම් ස්නානය කර, සුවඳ විළවුන් ගල්වා, සලාත් ඉටු කර පසුව හජ් සඳහා චේතනා කරමින් ඉහ්රාම් පැළඳ තල්බියා පවසයි. උම්රාහි තල්බියා පවසන "ලබ්බයික් උම්රතන්" වෙනුවට හජ්හි "ලබ්බයික් හජ්ජන්" යනුවෙන් පවසා තල්බියා පවසයි

3 තම වන්දනා කටයුතු සම්පූර්ණ කිරීමට බාධා කරන යම් බාධකයක් ගැන බිය වූයේ නම්, ඉහ්රාම් පළඳින අවස්ථාවේ මෙසේ කොන්දේසි පනවා ගත යුතුයි. එනම්: "දෙවිඳුනි! මා ඔබට පිළිතුරු දෙමින් හඹා එමි, යම් බාධකයක් මා අවහිර කළේ නම්, එය මා බාධා කළ තත්ත්වයේ මම ඉන් ඉවත් වෙමි.) එසේ කවරෙකු කොන්දේසි පනවාගෙන ඔහුගේ වන්දනා කටයුතු සම්පූර්ණ කිරීමට යම් බාධාවක් ඔහුට ඇති වූ විටෙක ඔහුට ඉහ්රාමයෙන් ඉවත් විය හැකි අතර ඒ සඳහා ඔහු කෙරෙහි කිසිදු ප්රතිකර්මයක් නොපිහිටනු ඇත

4 පසුව අධික ලෙස තල්බියා පැවසිය යුතුය. එනම්
لبيك اللهم لبيك، لبيك لا شريك لك لبيك، إن الحمد والنعمة لك والملك لا شريك لك
ලබ්බයික අල්ලාහුම්ම ලබ්බයික්, ලබ්බයික ලා ෂරීක' ලක ලබ්බයික්, ඉන්නල් හම්ද වන්-නිඃමත ලක වල් මුල්ක ලා ෂරීක ලක්" පිරිමියා මෙය උස් හඬින් පවසයි. කාන්තාව ද පිටස්තර පිරිමින් නැති තැන එසේ උස් හඬින් පවසන්නීය. ඉහ්රාම් ඇඳගත් තැනැත්තා අධික ලෙස තල්බියා පැවසිය යුතුය. විශේෂයෙන් තත්ත්වයන් හා කාලයන් වෙනස් වන විට, උදාහරණයක් ලෙස ඉහළට නගින විට උස් හඬින් ද පහළට බසින විට පහත් හඬින් ද රාත්‍රිය හෝ දහවලට එළැඹෙන විට ද යනාදියෙනි

5 තල්බිය්යා පැවසීම ආගමානුගත වනුයේ ඉහ්රාම් පැළඳගත් අවස්ථාවේ සිට අවුරුදු දින ජම්රතුල් අකබාව වෙත ගල් විසි කිරීමට ආරම්භ කරන තෙක්ය

6 ඉහ්රාම් ඇඳගත් තැනැත්තා, ඉහ්රාමයෙන් නිදහස් වන තෙක් ඉහ්රාමය තුළ තහනම් කරන ලද කිසිදු කරුණක නියැලීමෙන් ප්‍රවේසම් වීම අනිවාර්යය වේ

# දෙවැන්න: මිනාවෙහි රාත්රිය ගත කිරීම



ضيوف الرحمن
hajjumrh.com

**පසුව අට වැනි දින මිනාව වෙත පිටත් වීම ඔහුට සුන්නා වේ.** එහිදී ළුහර්, අසර්, මග්රිබ්, ඉෂා සහ ෆජ්ර් ඉටු කරයි. එහි දී සලාත් ඒකාබද්ධ නොකර කෙටි කරනු ලැබේ. මක්නිසාදයත් නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් මිනාවෙහි සලාතය කෙටි කළ අතර ඒකාබද්ධ නොකළ බැවිනි



ضيوف الرحمن
hajjumrh.com

# තුන්වැන්න: අරෆාවෙහි නතර වීම හා මුස්දලිෆාවෙහි රාත්‍රිය ගත කිරීම



1 අරෆා නව වන දින හිරු උදා වූ විට, මිනාවේ සිට අරෆා දක්වා ගමන් කිරීමේදී පහසුකමක් ඇත්නම් මධ්‍යහ්න වේලාවේ නමිරා හි ගොඩ බසී. එසේ නොකළ ද වරදක් නැත. හේතුව නමිරා මස්ජිදයට ගොඩ බැසීම සුන්නාවක් වන බැවිනි

2 හිරු අවරට යෑමට ආරම්භ වූ විටෙක, නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් ඉටු කළ පරිදි ළුහර් හා අසර් රකආත් දෙක බැගින් ජම්උ තක්දීම් (අසර් සලාතය ඉදිරියට ගෙනවිත් ලුහර් සමග) ඒකා බද්ධ කර ඉටු කළ යුතු වේ

3 සලාතය අවසන් කළ පසුව දික්ර් හා දුආ සඳහා යොමු වෙයි. සර්වබලධාරී අල්ලාහ් වෙත බැගෑපත් වෙයි. කිබ්ලා දෙසට මුහුණ ලා දෑත් ඔසවා ගනිමින් තමන් ප්‍රිය කරන ප්‍රාර්ථනාව පවසා ප්‍රාර්ථනා කරයි

4 නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් එම :මහඟු ස්ථානයේ දී වැඩි පුර කළ ප්‍රාර්ථනාව වනුයේ

"لا إله إلا الله وحده لا شريك له، له الملك وله الحمد وهو على كل شيء قدير"

"ලා ඉලාහ ඉල්ලල්ලාහු වහ්දහු ලා ෂරීක ලහු ලහුල් මුල්කු වලහුල් හම්දු වහුව අලා කුල්ලි ෂෙයිඉන් කදීර්"

නැමදුමට සුදුස්සා අල්ලාහ් හැර වෙනත් දෙවියෙකු නැත. ඔහු ඒකීයය. ඔහුට කිසිදු හවුල්කරුවකු නැත. සර්ව රාජ්‍යය ඔහු සතුය. සියලු ප්‍රශංසා ද ඔහුට හිමිය. ඔහු සියලු දෑ කෙරෙහි බලවතාය

5 එහිදී ඔහු වෙහෙසට පත් වූයේ නම්, තම සගයින් සමග ප්‍රයෝජනවත් දෑ කතා කිරීමට හෝ ප්‍රයෝජනවත් පොත්පත්, විශේෂයෙන්ම අල්ලාහ්ගේ ත්‍යාගශීලිත්වය කීර්තිය හා ආශිර්වාදයන් හා බැඳුණු පොත්පත් තමන්ට පහසු පරිදි කියවීම එදින ඇල්ම ඇති කර ගැනීමට යහපත් වේ. පසුව අල්ලාහ් වෙත බැගෑපත්ව යොමු වී ප්‍රාර්ථනාවෙහි නිරත වෙයි. දහවල් අවසන් කාලයේ ප්‍රාර්ථනාවන්හි නිරත වීමට උනන්දු වෙයි. ශ්‍රේෂ්ටතම ප්‍රාර්ථනාව වනුයේ අරෆා දින කරන ප්‍රාර්ථනාවයි

6 අරෆා දින හිරු අවරට ගිය විට, මුස්දලිෆා වෙත ගමන් කරයි

7 වෙත ළඟා වූ විටෙක, මග්රිබ් රකආත් තුනක් ලෙස හා ඉෂා රකආත් දෙකක් ලෙස ඒකාබද්ධ කරමින් ඉටු කරයි

8 මධ්‍යම රාත්‍රියෙන් පසුව මිස මුස්දලිෆාවට ළඟා නොවනු ඇතැයි බියක් හට ගැනුනේ නම්, ඔහු මුස්දලිෆාවට ළඟා වීමට පෙර වුව ද සලාතය ඉටු කරයි. මධ්‍යම රාත්‍රියෙන් පසු කාලය දක්වා සලාතය ප්‍රමාද කිරීම අනුමත නොවන්නේය

9 මුස්දලිෆාවෙහි රාත්‍රිය ගත කිරීම. ෆජ්ර් උදා වූ විට, කල් ඇතිව අදාන් හා ඉකාමත් පවසා ෆජ්ර් සලාතය ඉටු කරයි

10 පසුව මෂ්අරිල් හරාම් වෙත ගොස් අල්ලාහ්ව ඒකීයත්වයට පත් කරමින් හා ශ්‍රේෂ්ඨත්වයට පත් කරමින් ගුණ ගායනා කර සැහැල්ලු තත්ත්වයට පත් වන තෙක් තමන් ප්‍රිය කරන ප්‍රාර්ථනාවන් අයැද සිටියි. මෂ්අරිල් හරාමයට යෑම ඔහුට පහසු කාර්යයක් නොවී නම් එම ස්ථානයේ සිටම ප්‍රාර්ථනා කරයි. එය නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන්ගේ ප්‍රකාශයට අනුවය. "මම මෙහි නතර වූයෙමි. එහි සියලු තැන් එහි ස්ථානය වේ." දික්ර් හා ප්‍රාර්ථනාවන්හි නිරතව සිටිය දී, කිබ්ලා දෙසට මුහුණලා දෑත් ඔසවා ඒවා ඉටු කළ යුතුය



# සිව්වැන්න: අවුරුදු දින ක්
# රියාවන්



1. හිරු උදා වීමට පෙර මුස්දලිෆාවෙන් පිටත්ව මිනා වෙත මුහස්සර් මිටියාවත දෙසින් යුහුසුළුව ගමන් කරයි

2. මිනාවට ළඟා වූ විට, මක්කාවට පරව පිහිටා ඇති ගල් විසිකරන අවසන් ස්ථානය වන ජම්රතුල් අකබාවට ගල් හතක් ගෙන, එකින් පසු එක විසි කරයි. ඒ සෑම එකක්ම සාමාන්‍යයෙන් රට ඉඳි ඇටයක ප්‍රමාණයෙන් විය යුතුය. සෑම ගල් කැලටයක් සමගම ඔහු තක්බීර් පවසයි

3. පසුව පහසුකමක් වී නම් සත්ව කැපය ඉටු කරයි

4. පසුව පිරිමියකු වී නම්, හිස මුඩු කරයි. එසේ නැතහොත් හිසකෙස් කොට කර ගනී. හිස මුඩු කිරීමට වඩාත් යෝග්‍යය. කාන්තාවක නම්, ඇයට ආගමානුගත වනුයේ මුඩු කිරීම නොව, කොට කිරීම පමණය

5. ගල් විසි කර, හිස මුඩු කළ විට, පළමු නිදහස ලබනු ඇත. එනම් බිරිය සමග කම්සැප විඳීම හැර අනෙකුත් සියලු දැයින් නිදහස් වී ඒවා ඔහුට අනුමත වේ

6. පසුව මක්කාව වෙත ගොස් තවාෆුල් ඉෆාලා ඉටු කරයි. පසුව තමත්තුඃ ක්‍රමයට හජ් ඉටු කරන්නේ නම් හජ් සඳහා වන සඊ ඔහු ඉටු කරයි. ඉෆ්රාද් හෝ කිරාන් ක් රමයට හජ් ඉටු කරන්නේ නම් තවාෆුල් කුදූම් හෙවත් සම්ප්‍රාප්තික තවාෆය ඉටු කිරීමෙන් පසුව සඊ ඉටු නො කරයි. ඔහු තවාෆය හා සඊ ඉටු කිරීම රාත්‍රිය දක්වා හෝ තමන්ට පහසු පරිදි දෙවන දිනය දක්වා ප් රමාද කරයි


ضيوف الرحمن
hajjumrh.com
පස්වැන්න: අය්යාමුත් තෂ්රීක්
දිනවල සිදු කරන ක්‍රියා

1 ගල් විසි කර, හිස මුඩු කර, තවාෆ් සිදු කර, සඊ ද ඉටු කළේ නම්, ඔහු සියලු දැයින් නිදහස් වනු ඇත. බිරිය සමග කම් සැප විඳීම ඇතුළුව සියලු දෑ ඔහුට අනුමත වනු ඇත

2 පසුව මිනාව වෙත ගොස් එහි එකොළහ, දොළහ හා දහතුන යන දිනයන්හි රාත්‍රිය ගත කරයි

3 හිරු මුදුනින් අවරට ගිය විට, ජම්රාත් (ගල් ගසන ස්ථාන) තුනටම ගල් විසි කරයි

4 එකළොස් වැනි දින මක්කාවට දුරින් හා මස්ජිදුල් හෙයිෆයට සමීපයෙන් ඇති ජම්රතුල් ඌලා නම් ස්ථානයට ගල් කැට හතක්, එකින් පසු එක විසි කරයි. සෑම ගලක් සමගම තක්බීර් පවසයි. පසුව මදක් ඉදිරියට ඇවිත් තමන් කැමති දෑ දීර්ග ලෙස ප්‍රාර්ථනා කරයි. දිගු වේලාවක් සිටගෙන සිටීමට අසීරු වූයේ නම් තමන්ට පහසු පරිදි ප්‍රාර්ථනාවෙහි නිරත වෙයි. එය සුළු කාලයක් වුව ද ඔහු සුන්නාවේ මහිමය ලබනු ඇත

5 පසුව ඒ අයුරින්ම ජම්රතුල් වුස්ථාවට ද ගල් ගසා, ඉන් පසුව ප්‍රාර්ථනාවෙහි නිරත වෙයි

6 පසුව එලෙසම ජම්රතුල් අකබාවට ද ගල් ගසයි. නමුත් ඉන් පසු ප්‍රාර්ථනාවෙහි නිරත නොවී නැවත හැරී එයි

7 පසුව එකොළොස් වැනි දින මෙන්ම දොළොස් වැනි දිනයේ ද ජම්රාවන්ට ගල් ගසයි. ජම්රාත්වලට ගල් ගසා අවසන් කළ විට ඔහු කැමති නම් කල් වේලා ඇතිව පිටත්ව යයි. මිනාවෙන් ඉවතට ගමන් කරයි

8 ඔහු කැමතිනම් ප්රමාද කරයි. ඒ අනුව දහතුන් වැනි දින රාත්රිය ද එහි ගත කර හිරු මුදුනින් අවරට යෑමෙන් පසුව පෙර පරිදිම ජම්රාත් තුනට ගල් විසි කරයි. එසේ ප්රමාද කිරීම උතුම් වේ

9 දහතුන් වැනි දින දක්වා ප්රමාද කිරීම දොළොස් වැනි දින මිනාවෙහි රැඳී සිටිමින් හිරු අවරට යෑමෙන් මිස නොවිය යුතුය. හිරු මුදුනින් අවරට යෑමෙන් පසුව ජම්රාත් තුනට ගල් ගසන තෙක් එය ප්රමාද කළ යුතු වේ

10 වන දින මිනාහි හිරු බැස යෑමට පෙර 12 නමුත් ඔහු පිටත්ව ගොස් රථවාහන තදබදය ආදිය නිසා ප්රමාද වුවහොත් ඔහුට එහි රැඳී සිටීමට අවශ්‍ය නොවේ; මන්ද හිරු බැස යන තෙක් ප්රමාද වූයේ ඔහුගේ තේරීම නොමැතිව ය

ضيوف الرحمن
hajjumrh.com

# හයවැන්න: තවාෆුල් විදා



1 මක්කාවේ සිට තම දේශය බලා පිටත්වීමට අදහස් කළ විටෙක සමුගැනීම සඳහා වන තවාෆය ඉටු කරන තෙක් ඉන් බැහැර නොවිය යුතුය

2 නමුත් ඔසප් කාන්තාව හා දරු ප්‍රසූතියෙන් පසු පශ්චාත් රුධිර වහනය වන කාන්තාව හැර. ඔවුන් දෙදෙනාට තවාෆුල් විදා අදාළ වන්නේ නැත. සමුගැනීම සඳහා මස්ජිදුල් හරම්හි දොරකඩ නතර වී සිටීම ද අවශ්‍ය වන්නේ නැත. ඊට හේතුව නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් විසින් ඒ ගැන සඳහන් කර නොමැති බැවිනි

3 ගමන පිටත්ව යෑමට සිතූ විටෙක, තවාෆුල් විදා හෙවත් සමුගැනීමේ තවාෆය මස්ජිදුල් හරම් සමග වූ අවසන් ගිවිසුම බවට පත් කර ගනීය

4 සමුගැනීමේ තවාෆයෙන් පසු තම හිත මිතුරෙක් බලාපොරොත්තු වීම, තම බෑගය ඔසවා ගෙන යෑම හෝ මාර්ගයේ අවශ්‍ය භාණ්ඩ මිලදී ගැනීම යනාදී හේතු මත මදක් නතර වීම වරදක් නැත. එහි දී තම ගමන ප්‍රමාද කිරීම චේතනා කරනවා මිස නැවත තවාෆ් ඉටු නො කරනු ඇත. උදාහරණයක් ලෙස දහවල් ආරම්භයේ ගමන පිටත්ව යෑමට සිතා සමුගැනීමේ තවාෆය සිදු කරයි. පසුව දහවල් අවසානය දක්වා ගමන ප්‍රමාද කරයි. ඔහුගේ අවසාන ක්‍රියාව තවාෆය බවට පත් කර ගනු පිණිස එය නැවත ඉටු කළ යුතුව ඇත

HADIYAH

HAJI & MU'TAMR'S GIFT

هدية

هدية الحاج والمعتمر

www.hadiyah.org.sa